# උතුරු පළාත් දෙමළ මාධ්‍ය පාසල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියේ තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2017(III)

උතුරු පළාත් පැසැල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියේ තනතුරු වල පහත I - වන වගුවේ සඳහන් වන පරිදි අදාළ පුරප්පාඩු වලට (පුරප්පාඩු සංඛ්‍යාව ඇමුණුම - I හි සඳහන් කර ඇත) සිංහල මාධ්‍යයෙන් උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති උපාධිධාරීන්ගෙන් අයඳුම්පත් කැඳවනු ලැබේ. II - වන වගුවේ සඳහන් වන විෂයයන් වලට සුදුසුකම් ඇති අපේක්ෂකයින් හට මේ සඳහා ඉල්ලුම් කළ හැක ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය **2017.08.04** වේ.

**2.0 බඳවා ගැනීමේ කොන්දේසි :-**

02.1 2014.10.23 වන දින අංක 1885/38 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව සේවා කොන්දේසි හා එම සේවා ව්‍යවස්ථාවට කලින් කලට කරනු ලබන වෙනස්කිරීම් වලටත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ 2013.07.03 වන දින අංක 1817/30 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ක්‍රියා පරිපාටික රීති සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා ලද අයඳුම්කරුවන් එම තනතුරේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත් වන අයඳුම් කරුවන් පත්වීම් දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

02.3 මෙම සේවය ස්ථාන මාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන අය උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතු යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4 කිසියම් සේවා ස්ථානයක් වෙත පත්වීම් ලබන්නෙකු එකී සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 10ක් අඛණ්ඩව සේවය කළ යුතු බවට අනිවාර්යය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධව වරින් වර නිකුත් කරනු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීම් දින සිට වසර 5ක් අවසන් වීමට පෙර එහි සඳහන් දෙවන රාජ්‍ය භාෂාව සමත් විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක කරනු ලබන දිනය පිළිබඳ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. පත්වීම් සියල්ලම හෝ ඉන් කොටසක් සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

**3.0 වැටුප් පරිමාණය:-**

මෙම තනතුරට අලුතින් බඳවා ගනු ලබන ගුරුවරයෙකු පත්වීම් ක්‍රියාත්මක වන දින සිට අංක 03/2016 දරණ හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව GE - 1 - 2016 ට අනුව මාසික වැටුප් පරිමාණය **27,740 - 6 x 300 - 7 x 380 - 2 x 445 - 33,090/=**වේ. I - වන උප වගුවේ සඳහන් වූ පරිදි 14 වන වැටුප් තලය වන**32,200/=**පිහිටවනු ලැබේ. කෙසේ වුවද,පත්වීම් ලාභීන්ට අදාළ වැටුප, II වන උප ලේඛනයට අනුව රු **22,204/=**ක් ගෙවන බවටත් වැටුප් ගැලපීමට අනුව රු **6444/=**ක් ද ගෙවනු ලැබේ. මීට අමතරව රජය විසින් රජයේ සේවකයන් වෙත කලින් කලට ගෙවනු ලබනු ගෙවීම් වලට හිමිකම් ඇත.

**4.0 සාමාන්‍ය සුදුසුකම්:-**

04.1 අයඳුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

04.2 අයඳුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. එනම් මෙම අයඳුම්කරුවන් අයඳුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්ව වශයෙන් වසර 06ක කාලයක් තුළ අඩුම වශයෙන් වසර තුනක් හෝ උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටි අයෙකු විය යුතුය.

**හෝ**

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අඩුම වශයෙන් වසර 5ක් වත් උතුරු පළාතේ නොකඩවා පදිංචි වී සිටි අය විය යුතුය.(සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

04.3 අයදුම්කරු උතුරු පළාතේ කුමන ප්‍රදේශයක හෝ සේවය කිරීමට හැකි පරිදි මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා හොඳ චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

04.4 මෙම අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ඉල්ලුම් කර ඇති සුදුසුකම් සියල්ලම සපුරා තිබිය යුතුය.

04.5 අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

## 5.0 අධ්‍යාපන සුදුසුකම්:-

05.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් වී ඇති පරිදි **2017.08.04** වන දිනට හෝ ඊට පෙර මධ්‍යම රජයේ ගුරු පත්වීම් වලට අදාළ අනුමත විශේෂ විෂයයන් වලට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත්, උපාධි ප්‍රදානය කරනු ලබන වෙනත් ආයතනයක් මගින් ලබා ගන්නා ලද විශ්ව විද්‍යාල උපාධි සුදුසුකම් සහතිකය. (II වන වගුවේ සඳහන් වන පරිදි) ලබා තිබිය යුතුය.

ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර හා ලබා තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

හා

05.2 අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේ භාෂාව හා සාහිත්‍යය, ගණිතය යන විෂයයන් අනිවාර්යයයෙන්ම සමත් වී තිබිය යුතුය.

## 6.0 බඳවා ගැනීමේ ක්‍රමය:-

06.1 ලිඛිත පරීක්ෂණයේ කුසලතාව මත ද බඳවා ගන්නා අවස්ථාවේ ක්‍රියාත්මකව ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ වලටද, බඳවා ගැනීමේ පරිපාටි වලටද, රාජ්‍ය හා පළාත් ප්‍රතිපත්ති වලටද අනුව බඳවා ගනු ලැබේ. මෙම දැන්වීමේ ඉල්ලා ඇති සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුරට අයත් හිමිකම් සියල්ලම අහෝසි කරනු ලැබේ. අපේකෂකයන් සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රායෝගික පරීක්ෂණයකටදපෙනී සිටිය යුතුය. මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් නොකරන ලද සහතික පසුව සැළකිල්ලට ගනු නොලැබේ.

06.2ඉහත සුදුසුකම් ඇති හා ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් ඔවුන් ලැබූ මුළු ලකුණු වල අනුපිළිවෙළට අනුව සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ. අදාළ ඩිස්ත්‍රික්කේ සුදුසුකම් ලත් අපේක්ෂයන් නැතිවුවත් ඊට ආසනපිගිටි ඩිස්ත්‍රික් සිට සමූඛපරික්ෂණය සඳහා අපේක්ෂයන් දොරාගනු ලැබේ.

06.3 පුරප්පාඩු වලින් 3%ක් අබාධිතයින් සඳහා වෙන් කරනු ලැබේ. අබාධිත අයදුම්කරුවන් පත්වීම සඳහා තේරීමේ දී අදාළ තනතුරේ සේවය කිරීමට ඔහුගේ අබාබිත තත්ත්වය රාජකාරී කටයුකතු කිරීමට බාධාවක් නොමැති බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

## 07.0 විභාග ගාස්තු :-

අයදුම්කරුවන් පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් රු 500/=ක මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 3401 දරණ ගිණුමට ගෙවීම් කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැලවෙන පරිදි අලවා යොමු කළ යුතුය. කුමන හේතුවක් මත හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 8.0 ඉල්ලුම් කරන ක්‍රමය:-

08.1 මෙම දැන්වීමේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ (සෙ.මී.21 x සෙ.මී.29) කොළයක භාවිතා කරමින් 01 සිට 10 දක්වා වූ කොටස් පළමු වැනි පිටුවටද,

ඉතිරි ඒවා අනෙක් පිටුවටද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍ර පිළියෙල කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2017.08.04** වන දිනට හෝ ඊට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත. අංක 393/48, කෝවිල පාර, යාපනය.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08.2 අයදුම්පත්‍රයේ අංක 01 හියටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේ දි සම්පූර්ණ නමේ අවසානයට ඇති නම මුලින් සඳහන් කර අනතුරුව මුල් අකුරු නමෙහි අගට සඳහන් කළ යුතුය.

**උදාහරණ:-** අයදුම් පත්‍රයේ 01 හි SISIRA KUMARA . H.M. යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් පැසැල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියේ තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2017 (III)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.4 උපාධිධාරීන් තමන්ගේ සුදුසුකම් වලට අදාළ විෂයයන් වලට පමණක් අයඳුම් කිරීමේදී එම විෂයයන් සඳහන් කරමින් එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එම විෂයයන් වලට අදාළව පත්වීම් ලබා දෙනු ලැබේ. ගුරු සේවයට අයඳුම් කරන විෂය / විෂයයන් පසුව කුමන හේතුවක් මත හෝ මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08.5 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ.විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බව අදහස් නොකෙරේ.

08.6 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව පහත සඳහන් විස්තර සහිතව **ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය.(දුරකතන අංකය 021- 221 9939, ෆැක්ස්අංකය 021- 221 9940)

**සටහන:**

ඉල්ලීමේ ලිපිය , විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල්ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් යවන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ඡායා පිටපත , ප්‍රවේශ පත්‍රය යැවිය යුතු ෆැක්ස් අංකය.

## 09.0 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම:-

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ.පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගනු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත .
(11) වලංගුවිදේශ ගමන් බලපත්‍රයක්. (Passport)

ඉහත සඳහන් ලේඛනයන්ගෙන් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නිති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නිති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

## 10.0 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි.මෙම විභාග පරිපාටියට අනුව යම්කිසි අපේක්ෂකයෙක් විභාගයට පෙර හෝ විභාගය පවත්වන විට හෝ විභාගයෙන් පසුව හෝ කුමන අවස්ථාවකදී සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාග අයිතිය එම අවස්ථාවේවදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, කුමන අවස්ථාවක හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

**11.0 විභාග පරිපාටිය:-**

**11.1 ලිඛිත පරීක්ෂණය**

මෙම විභාගය පහත දැක්වෙන ප්‍රශ්ණ පත්‍ර දෙකකින් යුත් වේ. මෙම පරීක්ෂණය දේමළ හා සිංහල මාධ්‍යක් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම්කළ මාධ්‍ය පසුව වෙනස් කරීමට ඉඩදෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝගතා පරීක්ෂණය | ගුරු වෘත්තීය සඳහා අපේක්ෂකයා සතු කුසලතාවය, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීමේ අරමුණු කොටගෙන මෙම ප්‍රශ්ණ පත්‍රය සකසා ඇත. මෙය බහුවරණ තේරීම් හා කෙටි පිළිතුරු සැපයිය හැකි වන පරිදි ප්‍රශ්ණ 50කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනීම | ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනිම හෝ දේශිය වශයෙන් සිදු වී ඇති හා සිදුවිය හැකි අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිය හැකි පරිදි මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |

**සටහන:-**
මෙම විභාගය තරග විභාගයක් බැවින් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ වූ ලකුණු වලින් අඩුම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. කෙසේ වුවද අයදුම්කරු ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව (Merit Order)පත්වීම් ලබා දෙනු ලැබේ.

**11.2 ප්‍රායෝගික පරීක්ෂණය**

ලිඛිත පරීක්ෂණය සමත් වූ අපේක්ෂයින්ට ප්‍රායෝගික පරීක්ෂණය අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු වේ. මෙයට පහත දැක්වෙන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ අංශ | උපරිම ලකුණු මට්ටම | සමත් වීමට අවශ්‍ය ලකුණු මට්ටම |
|---|---|---|
| 01. අරමුණ හා ඉදිරිපත් කිරීම | 05 | 02 |
| 02. පෞරුෂත්වය හා පරිපාලනය | 05 | 02 |
| 03. විද්‍යුත් මාධ්‍ය සම්බන්ධ දැනීම | 05 | 02 |
| 04. කාල කළමනාකරණය | 05 | 02 |
| 05. ඉදිරිපත් කිරීමේ හැකියාව | 05 | 02 |
| **එකතුව** | **25** | **10** |

**12 විභාග ප්‍රතිඵල :-**

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.np.gov.lk වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුවඋතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**13 විභාග මධ්‍යස්ථාන:-**

විභාග පැවැත්වීමට යෝජිත නගර හා නගර අංක පහත සඳහන් වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 03 |

එක් විභාග නගරයක් වෙනුවෙන් ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් අඩු වූ විට අනෙක් විභාග නගරය වෙත විභාගය මාරු කරනු ලැබේ.

14 මෙම විභාගය පැවැත්විම හා අවළංගු කිරිමේ බලය "උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්"සතු වේ. ඒ සමගම දෙමළ හෝ සිංහල භාෂාවෙ යම් කිසි වෙනසක් ඇතොත්, දෙමළ භාෂාවෙන් සඳහන් නිවේදනය නිවැරදි බව සළකිය යුතුවෙ.

**සි.ඒ.මෝහන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
2017.07.05

## අධ්‍යාපන කලාප මට්ටම අනුව පුරප්පාඩු සංඛ්‍යා තොරතුරු (සිංහල මාධ්‍ය)

**(“-“ යන සඳහන්වන්නේ පුරප්පාඩු නැති බව)**

| | දෙමළ | ඉතිහාසය | ප්‍රජා පාලන විද්‍යාව (Civics) | දොරදුරු තාක්ෂණ | කෘෂිකර්මය හා ආහාර විද්‍යාව | මඟ පෙන්වීම හා උපදේස් | දෙවන භාෂාව සිංහල |
|---|---|---|---|---|---|---|---|
| යාපනය | - | - | - | - | - | - | 4 |
| වලිකාමම් | 10 | 4 | 2 | 4 | 1 | 6 | 8 |
| වලමරාට්චි | 1 | 3 | 3 | 2 | 3 | 3 | 6 |
| තෙන්මරාට්චි | - | 5 | 3 | 2 | - | 3 | 5 |
| දූපත් | 8 | 5 | 7 | 3 | 5 | 2 | 6 |
| කිලිනොච්චි | 12 | 6 | 6 | 4 | 11 | 8 | 8 |
| මුලතිවු | - | 4 | 3 | 2 | 8 | 7 | 4 |
| තුනුක්කායි | 7 | 2 | 1 | 2 | 9 | 4 | 9 |
| නවුනියා උතුර | 4 | 4 | 5 | 2 | 5 | 2 | 8 |
| නවුනියා දකුණ | - | 2 | 3 | 2 | 6 | 2 | 7 |
| මන්නාරම | 11 | 2 | - | 2 | 8 | 8 | 8 |
| මඩු | 8 | 3 | 6 | 2 | 1 | 2 | 5 |
| **මුළු** | **61** | **40** | **39** | **27** | **57** | **47** | **78** |

**විෂය කාණ්ඩය හා ඊට අදාළ අධ්‍යාපන සුදුසුකම් (සිංහල මාධ්‍ය)**

| විෂය අංකය | විෂය කාණ්ඩය | අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| I | දෙමළ | පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙමළ විෂය ප්‍රධාන විෂයයක් ලෙස/ විශේෂ විෂයයක් ලෙස ලබා ගත් කලා උපාධිය සුදුසුකම වශයෙන් තිබිය යුතුය. |
| II | ඉතිහාසය | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉතිහාසය විෂය ප්‍රධාන විෂයයක් ලෙස/ විශේෂ විෂයයක් ලෙස ලබා ගත් කලා උපාධිය තිබිය යුතුය.<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරාවිද්‍යා විෂය ප්‍රධාන විෂයයක් ලෙස/ විශේෂ විෂයයක් ලෙස ලබා ගත් කලා උපාධිය තිබිය යුතුය. |
| III | ප්‍රජා පාලන විද්‍යාව (Civics) | පිළිගත් විශ්ව විද්‍යාලයකින් දේශපාලන විද්‍යා යන විෂය ප්‍රධාන විෂයයක් ලෙස/ විශේෂ විෂයයක් ලෙස ලබා ගත් කලා උපාධිය තිබිය යුතුය. |
| IV | තොරතුරු තාක්ෂණ | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාහත් තොරතුරු තාක්ෂණවේදය හෝ පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් කුමන හෝ ප්‍රධාන විෂයයක් ලෙස ලබා ගත් උපාධිය තිබිය යුතුය. |
| V | කෘෂිකර්මය | පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය විෂය ප්‍රධාන විෂයයක් ලෙස / විශේෂ විෂයයක් ලෙස ලබා ගත් විද්‍යා උපාධිය තිබිය යුතුය.<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා උපාධිය (පරිසර විද්‍යාව) පාඨමාලාව සම්පූර්ණ කර උපාධිය තිබිය යුතුය. |
| VI | සිංහල දෙවන භාෂාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල භාෂාව විෂය ප්‍රධාන විෂයයක් ලෙස සමත් උපාධිය තිබිය යුතුය.<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාග් විද්‍යා (Linguistics) යන විෂය ඉගනගත් ශාස්ත්‍රවේදී උපාධිය (Linguistics Special) උපාධිය තිබිය යුතුය. |
| VII | මග පෙන්වීම හා උපදෙස් | පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝවිද්‍යාව යන විෂය ප්‍රධාන විෂයයක් ලෙස / විශේෂ විෂයයක් ලෙස ලබා ගත් උපාධිය තිබිය යුතුය.<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් මනෝවිද්‍යාව එක විෂය ලෙස සමාජ සේවා (Social work) උපාධිය තිබිය යුතුය.<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස / විශේෂ විෂයයක් ලෙස ලබා ගත් කලා උපාධිය තිබිය යුතුය. |

**සටහන:** ඉහත සඳහන් I සිට VII දක්වා විෂය කාණ්ඩය පළමුවෙනි අවුරුදු හෝ කුමන එක් අවුරුදේ ඉහත සුදුසුහම් සඳහන්වූ එක් විෂයක් ඉගනගත් ඇය ඉල්ලුම්කළ නෙහැක.